

# සදාතනික ආලෝකය

හේලීස් පීඑල්සී | වාර්ෂික වාර්තාවේ සාරාංශය 2024/25

# වාර්ෂික වාර්තාවේ සාරාංශය 2024/25

## හේලීස් සමාගමේ කාර්යභාරය

- අපි ශ්‍රී ලංකාවේ විවිධ අංශවලින් ප්‍රමුඛත්වයක් දරන්නා වූ ව්‍යාපාර සමූහයක එකතුවක් වන්නෙමු. එමෙන්ම අපි ආර්ථිකයේ ප්‍රධාන කර්මාන්ත අංශවල ව්‍යාපාරික උනන්දුවක් දක්වනු ලබන, රට තුළ සමාජීය සහ ආර්ථිකමය වෙනසක් ඇති කරනු ලබන සංවිධානයක් වන්නෙමු.
- ගෝලීය වශයෙන් ප්‍රමුඛත්වයක් දරන්නා වූ අංශ කිහිපයකින්ම ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන්නෙමු.
- විවිධ ව්‍යාපාර අංශ 14ක්
- සැපයුම් දාම, කෘෂිකාර්මික ජාල සහ බෙදාහැරීමේ ජාල හරහා ශ්‍රී ලංකාව පුරා පුළුල් සම්බන්ධිතාවයන් පවත්වා ගැනීම

### සමූහයේ කාර්යසාධනය

| | | |
|---|---|---|
| **රු. බිලියන 152**<br>ආර්ථික වටිනාකමක් උත්පාදනය | **38,029**<br>සේවකයින් | **රු. බිලියන 341**<br>සැපයුම්කරුවන්ට ගෙවීම් |
| **5.4%**<br>ශ්‍රී ලංකාවේ අපනයන සඳහා දායකත්වය | **74%**<br>පුනර්ජනනීය බලශක්තිය භාවිතය | **>27,000**<br>වටිනාකම් දාමයේ වක්‍ර රැකියා |

### අංශවල දායකත්වය

**පරිසර හිතකාමී විකල්ප**
ආදායම: **3%**
බදුවලට පෙර ලාභය :**-1%**

**අත් ආරක්ෂණ**
ආදායම: **9%**
බදුවලට පෙර ලාභය: **9%**

**පවිත්‍රකරණය**
ආදායම: **9%**
බදුවලට පෙර ලාභය: **13%**

**රෙදිපිළි**
ආදායම: **9%**
බදුවලට පෙර ලාභය: **7%**

**ඉදිකිරීම් ද්‍රව්‍ය**
ආදායම: **3%**
බදුවලට පෙර ලාභය: **3%**

**වැවිලි**
ආදායම: **4%**
බදුවලට පෙර ලාභය: **7%**

**කෘෂිකර්මය**
ආදායම: **8%**
බදුවලට පෙර ලාභය: **6%**

**පාරිභෝගික සහ විකුණුම්**
ආදායම: **22%**
බදුවලට පෙර ලාභය: **15%**

**සංචාරක**
ආදායම: **2%**
බදුවලට පෙර ලාභය: **-1%**

**කාර්මික යෙදවුම්, විදුලිබල සහ බලශක්තිය**
ආදායම: **2%**
බදුවලට පෙර ලාභය: **5%**

**ප්‍රවාහනය සහ සැපයුම්**
ආදායම: **22%**
බදුවලට පෙර ලාභය: **15%**

**ව්‍යාපෘති සහ ඉංජිනේරු**
ආදායම: **5%**
බදුවලට පෙර ලාභය: **8%**

**තේ අපනයන**
ආදායම: **3%**
බදුවලට පෙර ලාභය: **1%**

**අනෙකුත්**
ආදායම: **12%**
බදුවලට පෙර ලාභය: **1%**



# වාර්ෂික වාර්තාවේ සාරාංශය 2024/25

## 2024/25 සමාලෝචනය

වසර තුළදී ප්‍රවාහන සහ සැපයුම්, පාරිභෝගික සහ විකුණුම් සහ පවිත්‍රකරණය යන අංශ වලින් ලාභදායිතාවයට ඉහළම දායකයත්වයක් ලබා දීම හේතුවෙන් 13% කින් ආදායම වර්ධනය විය. ඒ අනුව හේලීස් සමූහය විසින් බදු ගෙවීමෙන් පසු ලාභය රුපියල් බිලියන 22.51 ක් ලෙස 52% ක වාර්ෂික වර්ධනයක් උත්පාදනය කරනු ලැබීය. සාර්ව ආර්ථිකය ස්ථාවර වීම, පාරිභෝගිකයන් කෙරෙහි වැඩි අවධානයක් දැක්වීම ඔස්සේ කලාපීය සහ ජාත්‍යන්තර වශයෙන් වර්ධනය වීමට සැලසුම් කිරීම සහ අගය එකතු කළ නිෂ්පාදන සහ අංශවලට යොමු කිරීම මගින් කාර්යසාධනය වර්ධනය විය. ප්‍රධාන අංශවල ප්‍රාග්ධන ආයෝජන මෙහෙයවනු ලැබීමෙන් වසර තුළදී සමූහය විසින් 16% ක වත්කම් වර්ධනයක් ද වාර්තා කරනු ලැබීය. එය අපගේ ඉදිරි ව්‍යාපාර දැක්ම පිළිබඳ අපගේ විශ්වාසය පිළිබිඹු කරන්නා සේම අපගේ දිගුකාලීන ඉපැයීම් තවදුරටත් ශක්තිමත් කරනු ලබයි.

| කොටසකට ඉපැයීම් (රු.) 95% | |
|---|---|
| 2022/23 | 21.80 |
| 2023/24 | 9.19 |
| 2024/25 | 17.93 |

| වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය (රු. මිලියන) 67% | |
|---|---|
| 2022/23 | 54,000 |
| 2023/24 | 61,575 |
| 2024/25 | 102,750 |

| කොටසකට ශුද්ධ වත්කම් වටිනාකම (රු.) 16% | |
|---|---|
| 2022/23 | 105 |
| 2023/24 | 107 |
| 2024/25 | 124 |

### වර්ෂයේ වැදගත් සිදුවීම්

| Strategic Market Diversification | Innovating for Greater Impact | Advancing Sustainability |
|---|---|---|
|  |  |  |

**Strategic Market Diversification**

- **1.67 මිලියන** පාරිභෝගිකයන් වැඩි කර ගැනීම
- භූගෝලීය විවිධාංගීකරණය
- **53%** අපනයන වලින් ලද ආදායම
- **21** නියෝජනය කරනු ලබන රටවල

**Innovating for Greater Impact**

- **474** නව නිෂ්පාදන සංවර්ධනය
- **757** ඉදිරිපත් කිරීමට නියමිත නිෂ්පාදන
- බලශක්ති ගබඩා කිරීම සඳහා නව විසඳුම්
- තිරසාර නවෝත්පාදනය
- විදුලියෙන් ක්‍රියාත්මක වන වාහන කර්මාන්තයට අවශ්‍ය අත් ආවරණ සැකසීම
- ඉදිරියේදී උසස් රෙදිපිළි නිර්මාණයට සැලසුම් කිරීම

**Advancing Sustainability**

- හේලීස් ලයිෆ්කෝඩ් හි 2 වන සංස්කරණය
- සමාගම් තුනක් විසින් SBTi ඉලක්කය
- **74%** පුනර්ජනනීය බල ශක්ති භාවිතය
- සමූහයේ ඍජුව සහ වක්‍රව විමෝචනය වන හරිතාගාර වායු 56%කින් වළක්වා ගැනීමට ප්‍රමාණවත් පුනර්ජනනීය බලශක්ති උත්පාදනය
- රු. බිලියන **341** සැපයුම්කරුගේ ගෙවීම්
- රු. මිලියන **451** ප්‍රජා දියුණුව සඳහා ආයෝජනය

**මෙහෙයුම් පුළුල් කිරීම**

| වැවිලි අංශය | අත් ආවරණ අංශය | පවිත්‍රකරණය | ඉදිකිරීම් ද්‍රව්‍ය | ප්‍රවාහන සහ සැපයුම් |
|---|---|---|---|---|
| කිරුවනගඟ අති නවීන තේ කර්මාන්ත ශාලාව | තායිලන්තයේ නව කර්මාන්ත ශාලාවක ව්‍යාපාර දියත් කිරීම<br>හංවැල්ල කර්මාන්ත ශාලාවේ ධාරිතාව පුළුල් කිරීම | නිෂ්පාදන වෙනුවෙන් වූ 7 වන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා කල්බදු දේපලක ආයෝජනය | 'Ascend' නව නිෂ්පාදනය ආරම්භ කිරීම | වග් යාත්‍රා 3 ක් මිලදී ගැනීම සමග සමුද්‍ර වත්කම් බලඇණිය පුළුල් කිරීම |

# වාර්ෂික වාර්තාවේ සාරාංශය 2024/25

| | 2025 | 2024 | වෙනස % |
|---|---|---|---|
| **මූල්‍ය කාර්යසාධනය** | | | |
| ආදායම (රු. මිලි) | **492,201** | 436,762 | 13 |
| පොලී, බදු, ක්ෂයවීම් සහ ක්‍රමක්ෂයට පෙර ඉපැයීම් (EBITDA) (රු. මිලි) | **60,019** | 53,507 | 12 |
| පොලී, සහ බදුවලට පෙර ඉපැයීම් (EBIT) (රු. මිලි) | **47,767** | 42,723 | 12 |
| බදු වලට පෙර ලාභය (රු. මිලි) | **35,373** | 25,336 | 40 |
| ආදායම් බදු (රු. මිලි) | **12,860** | 10,489 | 23 |
| බදු වලට පසු ලාභය (රු. මිලි) | **22,513** | 14,847 | 52 |
| මව් සමාගමේ හිමිකරුවන්ට ආරෝපණය කළ යුතු ලාභය (රු. මිලියන) | **13,449** | 6,889 | 95 |
| කොටසක ඉපැයුම (මූලික) (රු.) | **17.93** | 9.19 | 95 |
| ලාභාංශය (රු. මිලි) | **4,500** | 4,013 | 12 |
| මුළු වත්කම් (රු. මිලි) | **510,693** | 442,044 | 16 |
| මුළු ණය (රු. මිලි) | **204,410** | 171,883 | 19 |
| මව් සමාගමේ කොටස් හිමියන්ට ආරෝපණය කළ යුතු හිමිකම් (රු. මිලියන) | **93,142** | 80,163 | 16 |
| උත්පාදනය ලද ආර්ථික වටිනාකම (රු. මිලි) | **152,404** | 149,840 | 2 |
| කොටසකට වෙළඳපල වටිනාකම (රු.) | **137.00** | 82.10 | 67 |
| පොලී ආවරණය (වාර ගණන) | **3.13** | 1.94 | 61 |
| **ESG කාර්යසාධනය** | | | |
| බලශක්ති පරිභෝජනය (GJ mn) | **6.61** | 6.18 | 7 |
| % පුනර්ජනනීය බලශක්ති පරිභෝජනය | **74** | 72 | 3 |
| මුළු කාබන් පියසටහන ($tCO_2e$) | **760,245** | 214,008 | 255 |
| 1 වන මට්ටමේ විමෝචනය | **112,756** | 106,799 | 6 |
| 2 වන මට්ටමේ විමෝචනය | **70,520** | 71,740 | -2 |
| 3 වන මට්ටමේ විමෝචනය | **576,969** | 35,469 | 1527 |
| මුළු ජල පරිභෝජනය ($m^3$ mn) | **7.29** | 7.03 | 4 |
| ප්‍රතිචක්‍රීකරණය කළ ජල භාවිතය (%) | **13** | 14 | -7 |
| වැටුප් ලබන සේවකයින් (ගණන) | **38,029** | 36,266 | 5 |
| නව බඳවාගැනීම් (ගණන) | **10,686** | 9,635 | 11 |
| පුහුණුව සඳහා ආයෝජන (රු.මි.) | **195** | 183 | 6 |
| පුහුණු පැය (ගණන) | **434,715** | 369,589 | 18 |
| නිෂ්පාදන ගණන (ගණන) | **474** | 624 | -24 |
| සැපයුම්කරුවන්ට ගෙවීම් (රු.මි.) | **341,309** | 325,356 | 5 |
| CSR සඳහා ආයෝජනය (රු.මි.) | **451** | 408 | 10 |

# වාර්ෂික වාර්තාවේ සාරාංශය 2024/25



## සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරිතුමන්ගේ අදහස්



"සමූහය සිය ව්‍යාපාර දේශීය ආර්ථිකය පදනම්ව ගොඩනැගූ අතර, එය ජාත්‍යන්තර ව්‍යාපාරයක් ලෙස පුළුල් කිරීමට සැලසුම් කිරීම හේතුවෙන් මේ වන විට එහි ශක්‍යතාවයන් සහ පරිමාණය වර්ධනය කර ගැනීමට සමත් වී ඇත. වසර සඳහා අප කළ සැලසුම්වල ප්‍රතිඵලයක් ලෙස, සමූහය සිය ඒකාබද්ධ ආදායම වාර්තාගත ලෙස රුපියල් බිලියන 492.20ක් ලෙස වාර්තා කරමින් 13%ක් වර්ධනයක් අත්කර ගැනීමට සමත් වූ බවත්, සමාලෝචනයට භාජනය වන වසර තුළ බදු ගෙවීමට පෙර ලාභය (PBT) රුපියල් බිලියන 35.37 ලෙස 40% කින් වර්ධනය කර ගැනීමට සමත් වූ බවත් මම ඉතා සතුටින් දන්වා සිටිමි."

### අනපේක්ෂිතභාවයෙන් පිරි ලෝකයක්: බලාපොරොත්තුවෙන් ආලෝකමත් වූ ජාතියක්

→ 2024 වර්ෂයේ මෙහෙයුම් කටයුතු වැඩිවන දේශපාලන, ආර්ථික, පාරිසරික සහ සමාජ විපර්යාස හමුවේ බලපෑමට ලක් විය.

→ පීඩාකාරී ගෝලීය වාතාවරණයක් මධ්‍යයේ, වසර ගණනාවක දීර්ඝ අභියෝගවලින් පසු යම් බලාපොරොත්තුවක් ඇති කරමින් ශ්‍රී ලංකාව ක්‍රමයෙන් ස්ථාවරත්වයකට පැමිණෙමින් සිටි.

→ සංචාරක අංශය යථා තත්ත්වයට පත්වීමත් සහ සේවක ප්‍රේෂණ වැඩි වීමත් සමඟ රටේ විදේශ අංශය දියුණුවක් ලද අතර විදේශ විනිමය ද්‍රවශීලතා පීඩනයන් ලිහිල් විය. එහි ප්‍රතිඵලයක් ලෙස, වසර තුළ ශ්‍රී ලංකා රුපියල ශක්තිමත් වූ අතර, මූල්‍ය වර්ෂය තුළ 6% කින් පමණ එහි අගය (මාසික සාමාන්‍ය අනුපාත මත පදනම්ව) වර්ධනය විය.

### කාර්යසාධනයේ දළ විශ්ලේෂණය

→ සමූහයේ ඒකාබද්ධ ආදායම රු. බිලියන 492.20 ලෙස 13%කින් වර්ධනය විය. එය සමූහයේ මෙහෙයුම් අංශයේ මෙතෙක් වර්තා වූ ඉහළම ආදායම වේ. සමූහයේ අපනයන අංශය විසින් විනිමය අනුපාතිකයේ වෙනස්කම් හමුවේ වුවද, සමූහයේ ආදායමට ප්‍රධාන දායකත්වයක් ලබා දෙන අත් ආරක්ෂණ' අංශය, රෙදිපිළි අංශය සහ පවිත්‍රකරණ අංශය ශක්තිමත් කරමින් ඉහළ ශක්‍යතාවයක් ගොඩනගන ලද්දේය.

→ පාරිභෝගික සහ විකුණුම්, ප්‍රවාහන සහ සැපයුම් සහ පවිත්‍රකරණ අංශ ලාභදායිතාවයේ ප්‍රධාන දායකයකරුවන් බවට පත් වෙමින් වසර තුළ සමූහයේ බදු ගෙවීමට පෙර ලාභය රුපියල් බිලියන 35.37ක් ලෙස 40%කින් වර්ධනය විය.

### පුළුල් සේවා ජාලයක්

→ අත් ආවරණ අංශය ශ්‍රී ලංකාවට පමණක් සීමා නොවෙමින් Hi-Care Thai Gloves සමාගම අත්කර ගනිමින් තායිලන්තයේදී සිය දෙවන නිෂ්පාදන සමාගම ස්ථාපිත කළේය.

→ පවිත්‍රකරණ අංශය පිලිපීනයේ PHIVIDEC කාර්මික වතුයායේ නව කර්මාන්තශාලාවක් ඉදිකිරීම සඳහා කල්බදු ගිවිසුමකට එළැඹෙමින් නියාමන අනුමැතිය ලබා ගත්තේය.

→ Hayleys Advantis හි දිගුකාලීන උපායමාර්ගය ක්‍රමයෙන් කලාපීය මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය වීමටය එමගින් කලාපීය වෙළඳපොළ වෙත ශ්‍රී ලාංකීය නාමය ගෙන යනු ලබයි.

### පාලනය - වෙනස්වීම් හසුරවන බලවේගය

→ අධ්‍යක්ෂ මණ්ඩලය කුසලතා, හැකියාවන් සහ ක්ෂේත්‍රයේ අත්දැකීම් ආදියෙන් පිරි කණ්ඩායමක් වන හෙයින් වඩාත් ශක්තිමත් සහ කාර්යක්ෂම තීරණ සහ සාකච්ඡාවලට එළැඹීමට හැකියාව ලැබී ඇත.

→ වසර තුළදී නව අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු පත් කරන ලදී.
- ධම්මික පෙරේරා මහතා සමසභාපති සහ විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරන ලදී.
- ජොනතන් අලස් මහතා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරන ලදී.

→ 2025 ජනවාරි 1 වන දින නියම කර ඇති අනුකූලතා කාල සීමාව තුළ, ලැයිස්තුගත ආයතනවලට අදාළ වන ආයතනික පාලනය පිළිබඳ ලැයිස්තුගත කිරීමේ රීති අංක 9 හි විධිවිධානවලට සමූහය පූර්ණ අනුකූලතාවයක් ලබා ගෙන ඇත.

### පාරිසරික, සමාජීය සහ පාලනය ඒකාබද්ධ කිරීම - ආලෝකය ව්‍යාප්ත කිරීම

→ හේලීස් සමූහය සිය Lifecode හි දෙවන සංස්කරණය දියත් කළේය. එහිදී සමූහයේ පාරිසරික, සමාජීය සහ පාලන සැලසුම් (ESG) දිගුකාලීන කැපවීම් හයක් ලෙස ඉදිරිපත් කළ අතර නව ඉලක්ක හඳුන්වාදෙමින් සහ ප්‍රතිපත්ති රාමුව නවීකරණය කිරීම සිදු කොට ඇත.

→ සමූහයේ මෙහෙයුම් කටයුතුවල සැලකිය යුතු වර්ධනයක් පැවතියද, සමූහයේ පළවන මට්ටමේ සහ දෙවන මට්ටමේ හරිතාගාර වායු විමෝචනයේ වැඩිවීමේ ප්‍රතිශතය 3% ක් වූ අතර විමෝචන තීව්‍රතාවය 14% කින් අඩු විය.

→ අපි අරමුණු පෙරදැරි කරගනිමින් කටයුතු කරන්නෙමු, කරනු ලබන සෑම කටයුත්තක්ම හදවතට එකඟව ඉටු කරන්නෙමු. එකී කටයුතුවල සාර්ථකත්වය අපගේ විශේෂ වූ පාරිභෝගික ජාලය, සැපයුම්කරුවන්, ව්‍යාපාරික හවුල්කරුවන් සහ ප්‍රජාව තුළින් දැකීමට අපි අපේක්ෂා කරන්නෙමු.

### ඉදිරි දැක්ම

→ වෙනස් වෙමින් පවතින ගෝලීය පසුබිම හමුවේ වුවද, ජාතියේ සාර්ව ආර්ථික ගමනේ වර්ධනය අපගේ අනාගත කටයුතු හැඩගස්වා ගැනීමට මහත් උපකාරී වේ යැයි මම විශ්වාස කරමි.

→ ආර්ථික, සමාජීය සහ පරිසරික සමෘද්ධියට අනුව අපගේ දියුණුව තීරණය වන බැව් අවබෝධ කරගනිමින් අපි ඩිජිටල් පරිවර්තනය සහ පාරිසරික, සමාජීය සහ පාලනය ඒකාබද්ධ කරගැනීම තුළින් අනාගත සැලසුම් සහිත නවෝත්පාදන සංවිධානයක් බවට වෙනස් වෙමින් සිටින්නෙමු.

# වාර්ෂික වාර්තාවේ සාරාංශය 2024/25

## ආයතනික පාලනය

"එලදායී හා වඩාත් සුදුසු පාලනයක් තුළින් අපි අදාළ නීති, සංග්‍රහ සහ හොඳම භාවිතයන්ට අනුකූල වන බව සමූහයේ පාලන රාමුව මගින් සහතික කරනු ලබයි. හේලීස් සමාගම ආචාර ධර්ම සහ සදාචාරය අඛණ්ඩව පවත්වා ගනිමින් ක්‍රියාත්මක වන බවට අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සහතික කරනු ලබයි. එමගින් විවිධ කොටස්කරුවන්ගේ සහ ප්‍රාග්ධන සම්පත්වල අවශ්‍යතා ආරක්ෂා කරන අතරම වගවීම සහ එලදායී නායකත්වය සහතික කරයි."

### 2024/25 වර්ෂයේ සුවිශේෂී අවස්ථා

#### අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීම

- පී. වයි. එස්. පෙරේරා මහතා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරන ලදී.
- ඒ. ජේ. අලස් මහතා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරන ලදී.
- කේ. ඩී. ඩී. පෙරේරා මහතා සම සභාපතිවරයෙකු ලෙස සහ විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරන ලදී.

එකතු කළ කුසලතා

බැංකුකරණය, මූල්‍ය, ආයතනික නායකත්වය සහ ව්‍යවසායකත්වය

#### සංයුතියේ වෙනස්කම්

නව අධ්‍යක්ෂවරුන් පත් කිරීමෙන් සහ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු විධායක නොවන අධ්‍යක්ෂවරුන් ලෙස නැවත වර්ගීකරණය කිරීමෙන් පසුව, සංයුතිය පහත පරිදි වෙනස් විය:

- 6 විධායක අධ්‍යක්ෂවරුන්
- 3 විධායක නොවන අධ්‍යක්ෂවරුන්
- 4 ස්වාධීන අධ්‍යක්ෂවරුන්

#### ප්‍රතිපත්ති යාවත්කාලීන කිරීම

- නව ලැයිස්තුගත කිරීමේ රීති අවශ්‍යතාවලට අනුකූලව ප්‍රතිපත්ති අටක් නැවත සකස් කොට වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී.
- යාවත්කාලීන කරන ලද ප්‍රතිපත්ති සඳහා ගැනුම් ක්‍රියාවලිය සම්බන්ධ ප්‍රතිපත්තිය, ESG ආශ්‍රිත ප්‍රතිපත්ති, අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය සහ ප්‍රතිලාභ සහ වේතන ඇතුළත් වේ.

#### අධ්‍යක්ෂ මණ්ඩලයේ අරමුණු

- උපායමාර්ග ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම
- අවදානම් කළමනාකරණය
- අධ්‍යක්ෂ මණ්ඩල අනුප්‍රාප්තිය
- ඩිජිටල්කරණය සහ තොරතුරු තාක්ෂණය පාදක කරගත් පාලනයක් පවත්වා ගැනීම

### අධ්‍යක්ෂ මණ්ඩලය

මොහාන් පණ්ඩිතගේ මහතා
සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී

ධම්මික පෙරේරා මහතා
සම සභාපති සහ විධායක නොවන අධ්‍යක්ෂ

සරත් ගනේගොඩ මහතා
විධායක අධ්‍යක්ෂ

රාජිත කාරියවසන් මහතා
විධායක අධ්‍යක්ෂ

ජනාධිපති නීතිඥ, ආචාර්ය හර්ෂ කබ්රාල් මහතා
විධායක නොවන අධ්‍යක්ෂ

රුවන් වෛද්‍යරත්න මහතා
විධායක අධ්‍යක්ෂ

අරවින්ද පෙරේරා මහතා
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

ජයන්ති ධර්මසේන මහත්මිය
විධායක අධ්‍යක්ෂ

රොහාන් කාර් මහතා
විධායක අධ්‍යක්ෂ

ගාමිණී ගුණරත්න මහතා
විධායක නොවන අධ්‍යක්ෂ

තිමෝති ස්පෙල්ඩිවින්ඩ් මහතා
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

යොහාන් පෙරේරා මහතා
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

ජොනතන් අලස් මහතා
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

# වාර්ෂික වාර්තාවේ සාරාංශය 2024/25

## වටිනාකම් නිර්මාණය

### මූල්‍ය ප්‍රාග්ධනය

යෙදවුම්

රු. බිලියන 144
කොටස් හිමියන්ගේ අරමුදල

රු. බිලියන 204
ණය

**වටිනාකම් නිර්මාණය කිරීමේ කාර්යභාරය**

- සමූහය කලාපීය වශයෙන් මෙන්ම ධාරිතාවෙන්ද පුළුල් කිරීම සැලසුම් කිරීමට අරමුදල් සැපයීම.
- සිත්ගන්නා වේතනයක් පිරිනමමින් ශ්‍රී ලංකාවේ හොඳම දක්ෂතා ආකර්ෂණය කර ගැනීම සහ රඳවා ගැනීම.
- අපගේ නවෝත්පාදන සහ නිෂ්පාදන හැකියා මෙහෙයවීම.

රු. බිලියන 35 (+40%)
බදු වලට පෙර ලාභය

රු. බිලියන 4.5
සමාගමේ ලාභාංශය

### නිෂ්පාදන ප්‍රාග්ධනය

යෙදවුම්

රු. බිලියන 155
දේපළ, පිරියත සහ උපකරණ

**වටිනාකම් නිර්මාණය කිරීමේ කාර්යභාරය**

- උසස් තත්ත්වයේ, අභිරුචිකරණය කළ සහ තිරසාර නිෂ්පාදනයක් සඳහා පහසුකම් සැලසීම.
- විවිධ වූ සහ ඉක්මනින් වෙනස් වන ඉල්ලීම් සපුරාලීම.
- දිවයින පුරා සිටින පාරිභෝගිකයින් වෙත ප්‍රවේශ වීම.

1.04
වත්කම් පිරිවැටුම් අනුපාතය

4.25%
ප්‍රාග්ධන වියදම් ආදායම් අනුපාතය

### මානව ප්‍රාග්ධනය

යෙදවුම්

38,029
වැටුප් ලබන සේවකයින්

**වටිනාකම් නිර්මාණය කිරීමේ කාර්යභාරය**

- සමූහයේ සැලසුම්වල අරමුණු මෙහෙයවීම.
- පාරිභෝගික අත්දැකීම් උසස් කරලීම.
- නවෝත්පාදනයන් මෙහෙයවීම සඳහා දැනුම සහ බුද්ධිමය ප්‍රාග්ධනය උපයෝගී කර ගැනීම.

රු. බිලියන 56 (+5%)
සේවක ගෙවීම්

රු. මිලියන 195 (+6%)
පුහුණුව සඳහා ආයෝජන

### සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

යෙදවුම්

ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන් සහ කර්මාන්ත කොටස්කරුවන් සමඟ හවුල්කාරිත්වයන්

**වටිනාකම් නිර්මාණය කිරීමේ කාර්යභාරය**

- මෙහෙයුම් සඳහා සමාජ බලපත්‍ර ලබා දීම.
- ව්‍යාපාරවල අඛණ්ඩතාව තහවුරු කිරීම.

රු. බිලියන 341 (+5%)
සැපයුම්කරුවන්ට ගෙවීම්

රු. මිලියන 451 (+10%)
ආයතනික සමාජ වගකීම් සඳහා ආයෝජනය

### බුද්ධිමය ප්‍රාග්ධනය

යෙදවුම්

අපගේ සන්නාමයේ නව ශක්‍යතා පද්ධතිය, ක්‍රියාවලිය සහ තත්ත්වය ශක්තිමත් කරලීම

**වටිනාකම් නිර්මාණය කිරීමේ කාර්යභාරය**

- වර්ධනය සඳහා පවත්නා අවස්ථා අත්කර ගැනීමට ආයතනික ප්‍රාග්ධනය සහ ක්ෂේත්‍රයේ විශේෂ දැනුම ශක්තිමත් කරලීම.
- තරඟකාරීත්වය සමඟ කටයුතු කිරීමට නවෝත්පාදන යොදා ගැනීම.
- මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා තාක්ෂණය සහ ඩිජිටල්කරණය යෙදවීම.

රු. මිලියන 812 (+48%)
පර්යේෂණ සහ සංවර්ධන ආයෝජන

474
නව නිෂ්පාදන

### ස්වාභාවික ප්‍රාග්ධනය

යෙදවුම්

අක්කර 520
ඉඩම් ප්‍රමාණය

ගිගා ජූල් මිලියන 6.6
බලශක්ති පරිභෝජනය

ඝන මීටර් මිලියන 7.29
ජල භාවිතය

**වටිනාකම් නිර්මාණය කිරීමේ කාර්යභාරය**

- ජලය, බලශක්තිය සහ අමුද්‍රව්‍ය ඇතුළුව ව්‍යාපාර සඳහා අවශ්‍ය තීරණාත්මක සම්පත් සැපයීම.
- අපගේ කෘෂිකාර්මික යෙදවුම් සහ නිමැවුම්වල ගුණාත්මකභාවය සහ ප්‍රමාණය තීරණය කිරීම.
- පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් වෙත ප්‍රවේශය වීම තහවුරු කිරීම.

74%
පුනර්ජනනීය බලශක්තිය මත යැපීම

760,245
tCO2e emissions (Scope 1,2 and 3)

# වාර්ෂික වාර්තාවේ සාරාංශය 2024/25

## මෙහෙයුම් පසුබිම

| සාධකය | සංවර්ධනය | සමූහය වෙත මූලික බලපෑම් |
|---|---|---|
| ගෝලීය සාර්ව ආර්ථික තත්වයන් | • 2024 වර්ෂය, ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිත වර්ධනය 3.2% ක් සමඟින් ගෝලීය ආර්ථික ක්‍රියාකාරකම් ස්ථාවර වූවද, එහි විවිධ ගැටලු තත්ත්වයන් පැවතිණ (ලෝක ආර්ථික දැක්ම).<br>• එක්සත් ජනපදය මුල් කරගනිමින් 2024 දී දියුණු ආර්ථිකයන් 1.7%කින් වර්ධනය විය. චීනය සහ ඉන්දියාව යන රටවල් ද්විත්වය අපේක්ෂිත ප්‍රමාණයට වඩා අඩු වර්ධනයක් පෙන්නුම් කළ හෙයින් නැගී එන ආර්ථිකයන් 4.2%කින් වර්ධනය විය. | • ප්‍රධාන වෙළඳපොළවල පවතින ඉල්ලුමේ අවිනිශ්චිතතාව<br>• සැපයුම් දාමයේ බාධා සහ පිරිවැයට ඇතිවන බලපෑම්<br>• සමූහයේ කලාපීය වර්ධනය කිරීමේ සැලසුම් සඳහා අහිතකර බලපෑම් |
| දේශීය සාර්ව ආර්ථික තත්වයන් | • 2022 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන ලද ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵලයක් ලෙස 2024 වර්ෂයේදී ශ්‍රී ලංකාව සාර්ව ආර්ථික ස්ථාවරත්වයක් ලබා ගත්තේය.<br>• 2024 වර්ෂයේදී වෙළඳපළ පොලී අනුපාත පසුබෑමට ලක් වූ අතර ශ්‍රී ලංකා රුපියලේ වටිනාකමේ වර්ධනයක් ඇති විය. | • දේශීය ව්‍යාපාර සඳහා ශක්තිමත් වර්ධන අවස්ථා<br>• අපනයනය කෙරෙහි නැඹුරු අංශ කෙරෙහි අහිතකර බලපෑම්<br>• ණය ගැනීමේ පිරිවැය කෙරෙහි හිතකර බලපෑම |
| භූ දේශපාලනික විවිධත්වය | • වර්ෂය තුළ රාජ්‍ය අතර සන්නද්ධ ගැටුම්, ලෝක ආර්ථික සංසදයේ 2025 සඳහා වන ගෝලීය අවදානම් වාර්තාවේ (World Economic Forum's Global Risk Report for 2025) වඩාත්ම අවදානයක් ඇති වූ මාතෘකාවක් විය.<br>• මෑතකදී ප්‍රකාශයට පත් කරන ලද එක්සත් ජනපද තීරුබදු හේතුවෙන් ශ්‍රී ලංකා අපනයනවල තරඟකාරිත්වය අඩපණ වනු ඇත. එය රෙදිපිළි, රබර් සහ පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා බලපෑම් ඇති කරනු ඇත. | • ඇමරිකා එක්සත් ජනපදය මත බෙහෙවින් පදනම් වන රෙදිපිළි සහ පවිත්‍රකරණ අංශ කෙරෙහි අහිතකර බලපෑම් ඇති වීම.<br>• ගෝලීය සැපයුම් දාමවලට බාධා ඇති වීම සහ පිරිවැය සහ නිෂ්පාදන අඛණ්ඩතාව කෙරෙහි එහි බලපෑම |
| මෙහෙයුම් සඳහා නව ක්‍රම | • ශ්‍රම බලකායේ නව පරම්පරාවේ නැගී ඒම හේතුවෙන් සේවා ස්ථානවල වටිනාකම් වෙනස් වේ, ඔවුන් රැකියා කටයුතු සමතුලිතව පවත්වා ගැනීම කෙරෙහි අවධානය යොමු කරයි, පක්ෂපාතිත්වය පිළිබඳ නව අදහස් ඉදිරිපත් කරයි. | • ගෝලීය සැපයුම් දාමවල බාධා ඇති වීම සහ පිරිවැය සහ නිෂ්පාදන අඛණ්ඩතාව කෙරෙහි එහි බලපෑම |
| දේශගුණික අර්බුදය | • දේශගුණික විපර්යාස වැඩි වෙමින් පවතින අතර, වටිනාකම් දාමය, කෘෂිකාර්මික භාණ්ඩ, ප්‍රජාවන් සහ ආයතනික කාර්යසාධනයට බලපෑම් ඇති කරයි. | • කෘෂිකර්මාන්තයේ සහ වැවිලි අංශයේ ඵලදායීතාව සහ නිෂ්පාදන ප්‍රමාණය කෙරෙහි සෘජු බලපෑම්<br>• කෘෂිකාර්මික ද්‍රව්‍ය මත රඳා පවතින සැපයුම් දාමයන් ඔස්සේ ඇතිවන බාධා |



# වාර්ෂික වාර්තාවේ සාරාංශය 2024/25

## උපායමාර්ගික සැලසුම්

සමූහයේ ප්‍රධාන සැලසුම්වල අරමුණු එහි ආයතනික අරමුණට අනුකූල වේ. මෙම උපායමාර්ගය හේලීස් පීඑල්සී හි උපායමාර්ගික ව්‍යාපාර සංවර්ධන ඒකකය (SBDU) විසින් සකස් කරන ලද පදනම් පහක් අනුව ක්‍රියාත්මක වේ. සෑම අංශයක්ම සමූහ කළමනාකරණ කමිටුවේ නායකත්වය යටතේ ඊට අනුකූලව කටයුතු කරයි.

### ව්‍යාපාරික කළඹ ඵලදායීකරණය කිරීමෙන් ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම

උපායමාර්ගික ක්‍රියාමාර්ග

- භූගෝලීය පියසටහන පුළුල් කිරීම
- නිෂ්පාදන හැකියාවන් වැඩි දියුණු කිරීම
- පාරිභෝගික පදනම විවිධාංගීකරණය කිරීම
- පිරිවැය කළමනාකරණය සහ ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය

ප්‍රධාන කාර්ය දර්ශකය

- 13% ආදායම් වර්ධනය
- 12% පොලිය සහ බදුවලට පෙර ඉපැයීම්හි වර්ධනය
- 40% බදුවලට පෙර ලාභය වර්ධනය

### පාරිභෝගිකයා කේන්ද්‍ර කර ගැනීම

උපායමාර්ගික ක්‍රියාමාර්ග

- අගය එකතු කළ නිෂ්පාදන සංවර්ධනය
- තිරසාරභාවය පිළිබඳ පාරිභෝගික අවශ්‍යතා සපුරාලීම
- ප්‍රධාන අංශවල අලෙවියෙන් පසු සේවාව ශක්තිමත් කිරීම
- සමාජ මාධ්‍ය වේදිකා හරහා පාරිභෝගික සහභාගීත්වය වැඩි දියුණු කිරීම

ප්‍රධාන කාර්ය දර්ශකය

- ආරම්භ කළ නව නිෂ්පාදනඃ : 474
- අපේක්ෂිත නිෂ්පාදනඃ 757

### ප්‍රේරිත කණ්ඩායම් පෝෂණය කිරීම

උපායමාර්ගික ක්‍රියාමාර්ග

- ක්‍රමවත් අනුක්‍රමික සැලසුම් ක්‍රියාත්මක කිරීම
- සමස්ත සමූහයට අදාළ වන විවිධත්ව සාධාරණත්ව සහ සමාන අවස්ථා ලබාදීම සම්බන්ධ පුහුණු
- නායකත්ව සංවර්ධන වැඩසටහන්
- සේවක සහභාගිත්වය

ප්‍රධාන කාර්ය දර්ශකය

- සේවක රඳවාගැනීම්හි අනුපාතයඃ 76%
- සාමාන්‍ය පුහුණුකිරීම් පැය ගණනඃ 11.43
- මුළු ගෙවීම්ඃ රු. බිලියන 56

### සියල්ල ඇතුළත් වූ ව්‍යාපාර ආකෘතියක්

උපායමාර්ගික ක්‍රියාමාර්ග

- ප්‍රධාන ව්‍යාපාර අංශවල සැපයුම් දාමයේ ධාරිතාව වර්ධනය
- සමූහයේ ගැනුම් ක්‍රියාවලිය පිළිබඳ ප්‍රතිපත්තිය ශක්තිමත් කරලීම
- සැපයුම් දාම ඒකාබද්ධතාවය සහ සැපයුම්දාම විවිධාංගීකරණය
- ප්‍රජා සංවර්ධන මුලපිරීම් වෙනුවෙන් සැලසුම් කිරීම

ප්‍රධාන කාර්ය දර්ශකය

- දේශීය සැපයුම්කරුවන් සඳහා වියදම්ඃ 55%
- සැපයුම්කරුවන්ගේ ගෙවීම්ඃ රු. බිලියන 341
- ආයතනික සමාජ වගකීම් ප්‍රතිලාභීන්ඃ >640,000

### ESG ඒකාබද්ධ කිරීම

උපායමාර්ගික ක්‍රියාමාර්ග

- හේලීස් ලයිෆ්කෝඩ් හි 2 වන සංස්කරණය ඉදිරිපත් කිරීම
- අංශ 2ක් මගින් අංශ මට්ටමේ ESG මාර්ග සිතියම් ඉදිරිපත් කිරීම
- 3වන මට්ටමේ හරිත වායු විමෝචනය පිළිබඳ පුළුල් ආකාරයකින් ගණනය කිරීම
- කාර්තුමය වශයෙන් ESG මිනුම් වාර්තා කිරීම

ප්‍රධාන කාර්ය දර්ශකය

- පුනර්ජනනීය බලශක්තිය මත යැපීමඃ 74%
- බලශක්ති තීව්‍රතාවයඃ : -11%
- ජල තීව්‍රතාවයඃ -13%
- විමෝචන තීව්‍රතාවයඃ : -14%



# වාර්ෂික වාර්තාවේ සාරාංශය 2024/25

## මූලික අවදානම්

| අවදානම | අවදානම් ශ්‍රේණිගත කිරීම | | අවම කිරීමේ උපායමාර්ග |
|---|---|---|---|
| | 2025 | 2024 | |
| ආර්ථිකය | **9** | 9 | • අපනයන පුළුල් කිරීම හරහා දේශීය වෙළඳපොළ මත යැපීම අඩු කිරීම. |
| ද්‍රවශීලතා අවදානම සහ මූල්‍ය ස්ථාවරත්වය | **9** | 9 | • අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකරණය කමිටුව (GMC) හරහා ද්‍රවශීලතා අවදානම් අධීක්ෂණය වැඩි දියුණු කිරීම.<br>• ණය ගැනීම් කළමනාකරණය කිරීම සඳහා සමූහයේ සහයෝගීතාවයන් ලබා ගැනීම.<br>• අරමුදල් ප්‍රභවයන් විවිධාංගීකරණය කිරීම. |
| භූ දේශපාලනික අවදානම | **6** | 4 | • අපනයන වෙළඳපොළේ විවිධාංගීකරණය වැඩි කිරීම<br>• අගය එකතු කළ නිෂ්පාදන පිළිබඳ යෝජනා |
| දත්ත ආරක්ෂණය සහ සයිබර් ආරක්ෂණ අවදානම් | **6** | 6 | • ක්‍රියාත්මක වන තොරතුරු තාක්ෂණ පාලන ප්‍රතිපත්ති සහ ව්‍යුහයන්<br>• සයිබර් ආරක්ෂණ අවදානම් අවම කිරීම පිළිබඳ දැනුවත්භාවයක් නිතිපතා සේවකයින්ට ලබා දීම<br>• ක්‍රියාත්මක වන ව්‍යාපාර අඛණ්ඩතා සැලැසුම් ශක්තිමත් කරලීම |
| දේශගුණික විපර්යාසවල භෞතික අවදානම් | **6** | 6 | • කාලගුණික රටා සහ ඇතිවිය හැකි බලපෑම් සමීපව නිරීක්ෂණය කිරීම<br>• දේශගුණික අනුවර්තනය පියවර<br>• පාරිසරික කළමනාකරණ පද්ධති ශක්තිමත් කිරීම |
| දේශගුණික විපර්යාසවල සංක්‍රාන්ති අවදානම් | **6** | 6 | • තිරසාරභාවයට අදාළ ඉල්ලීම් හඳුනා ගැනීම සහ ඒවාට ප්‍රතිචාර දැක්වීමට ගනුදෙනුකරුවන් සමඟ සමීප සම්බන්ධතාවයක් පැවැත්වීම<br>• පුළුල් පාරිසරික ඉලක්ක |

මෙම සාරාංශයේ වර්ෂය තුළ සමූහය මුහුණ දුන් ප්‍රධාන අවදානම් පමණක් ලැයිස්තුගත කොට ඇත; අවදානම් සහ අවස්ථා පිළිබඳ සම්පූර්ණ ලැයිස්තුවක් සඳහා සවිස්තරාත්මක වාර්ෂික වාර්තාව බලන්න.



# වාර්ෂික වාර්තාවේ සාරාංශය 2024/25

## නිෂ්පාදිත කළඹ සමාලෝචනය

### කොහු ආශ්‍රිත නිෂ්පාදන

සමූහයේ පාරිසරික විසඳුම් අංශය අගය එකතු කළ පොල් කෙඳි නිෂ්පාදන කරනු ලබන ප්‍රමුඛතම නිෂ්පාදකයා වන අතර, නිෂ්පාදන කාණ්ඩ කිහිපයක් ඉදිරිපත් කරමින් උසස් තත්ත්වයේ, නව්‍ය සහ තිරසාර විසඳුම් මාලාවක් පිරිනමයි.

#### 2024/25 වර්ෂයේ සුවිශේෂී අවස්ථා

- කාර්ය සාධනය සඳහා ශ්‍රී ලංකා රුපියලේ අගය ඉහළ යාම සහ අමුද්‍රව්‍ය පිරිවැය ඉහළ යාම බලපෑම් ඇති කළේය. ඒ අනුව ආදායම අඩුවීම සහ ආන්තිකවලට බලපෑම් ඇති විය.
- තන්තු නිස්සාරණ පහසුකම් වෙනුවෙන් ආයෝජන සිදු කිරීමෙන් පසුබිම් ඒකාබද්ධතාවය ශක්තිමත් කරලීම
- අගය එකතු කළ නිෂ්පාදන සඳහා අඛණ්ඩ ආයෝජන සිදු කිරීම

#### ඉදිරි කටයුතු

අංශය සඳහා දිගුකාලීන ඉල්ලුම්වල විවිධත්වය, විශේෂයෙන් වගා මාධ්‍ය, ඛාදනය පාලනය සහ උද්‍යාන විද්‍යාව වැනි කාණ්ඩවල හිතකරව පවතී.

මෙම අංශය සැපයුම්දාම ඒකාබද්ධතාවය හරහා සැපයුම් දාම ආරක්ෂාව මෙහෙයවමින් නව යෙදුම් සහ වෙළඳපලවල වර්ධනය අඛණ්ඩව පවත්වාගනු ලබයි.

| | 2025 | % y-o-y |
|---|---|---|
| ආදායම (රු. බිලියන) | **12.85** | -7 |
| බදුවලට පෙර ලාභය (රු. මිලියන) | **(524)** | - |
| බදුවලට පසු ලාභය (රු. මිලියන) | **(520)** | - |
| වත්කම් (රු. බිලියන) | **20.76** | 4 |
| සේවකයින් (අංක) | **1,123** | - |
| කාබන් පියසටහන (tCO2e) | **10,875 (1,2 සහ 3 මට්ටම)** | |

**47** නව පාරිභෝගිකයින්

**96** නව සැපයුම්කරුවන්

**18** නව නිෂ්පාදන

### අත් ආරක්ෂණ අංශය

ආරක්ෂිත අත් ආවරණ සඳහා ගෝලීය ප්‍රමුඛයෙකු ලෙස Dipped Products PLC කටයුතු කරයි. එමගින් ස්වාභාවික සහ කෘත්‍රිම රබර් කිරි මත පදනම් වූ ගෘහ සහ කාර්මික අත් ආරක්ෂා සඳහා වන ගෝලීය ඉල්ලුමෙන් 5%කට ආසන්න ප්‍රමාණයක් ආවරණය කරයි.

#### 2024/25 වර්ෂයේ සුවිශේෂී අවස්ථා

- ඔරොත්තු දෙන කාර්යසාධනය මගින් නව සහ පවතින වෙළඳපලවල පරිමාව වර්ධනය කරමින් විනිවිදභාවයක් ඇති කිරීම.
- Hi-Care Thai Gloves Co., Ltd අත්පත් කර ගැනීම සහ හංවැල්ල කර්මාන්ත ශාලාව පුළුල් කිරීම තුලින් නිෂ්පාදන ධාරිතාවය ඉහළ නැංවීම
- ගෝලීය සහභාගිත්වය න් ඉහල නැංවීම සඳහා අලෙවිකරන අංශ ශක්තිමත් කිරීම

#### ඉදිරි කටයුතු

වෙනස්වන ගෝලීය වෙළඳ කටයුතු හමුවේ අවාසිදායක අවදානමක් පැවතියද, කර්මාන්ත අංශවලින් ලැබෙන ශක්තිමත් ඉල්ලුම සහ අගය එකතු කළ නිෂ්පාදන අංශවල පවතින ඉඩ ප්‍රස්ථාව හේතුවෙන් මෙම අංශය සඳහා හිතකර ඉදිරි දැක්මක් පැවතුණි. මෙම අංශය අගය එකතු කළ නිෂ්පාදන වලින් ලැබෙන දායකත්වය වර්ධනය කරමින් සාම්ප්‍රදායික නොවන වෙළඳපලවල වර්ධන අවස්ථා ඉදිරියටත් පවත්වා ගෙන යාමට කටයුතු කරයි.

| | 2025 | % y-o-y |
|---|---|---|
| ආදායම (රු. බිලියන) | **46.35** | 8 |
| බදුවලට පෙර ලාභය (රු. මිලියන) | **3.86** | -4 |
| බදුවලට පසු ලාභය (රු. මිලියන) | **3.26** | -11 |
| වත්කම් (රු. බිලියන) | **42.04** | 22 |
| සේවකයින් (අංක) | **2,570** | 18 |
| කාබන් පියසටහන (tCO2e) | **188,272 (1, 2 සහ 3 මට්ටම)** | |

**90%** ධාරිතාව භාවිතය

රු. මිලියන **616** තිරසාර නිෂ්පාදනවලින් ආදායම

**77** නව පාරිභෝගිකයින්

# වාර්ෂික වාර්තාවේ සාරාංශය 2024/25

## නිෂ්පාදිත කළඹ සමාලෝචනය

### පවිත්‍රකරණය අංශය

නවෝත්පාදනය, ගුණාත්මකභාවය, තාක්ෂණික විශිෂ්ටත්වය සහ තිරසාරභාවය සඳහා ඉහළ කීර්තියක් ලබමින් පොල් කටු මත පදනම් වූ සක්‍රිය කාබන් නිෂ්පාදනයේ යෙදෙමින් හේකාබ් (Haycarb) ගෝලීය ප්‍රමුඛයෙකු ලෙස කටයුතු කරයි.

#### 2024/25 වර්ෂයේ සුවිශේෂී අවස්ථා

- ශ්‍රී ලංකා රුපියලේ අගය ඉහළ යාම හේතුවෙන් ආදායම සුළු වශයෙන් පහත වැටුණු අතර, ගෝලීය වෙළෙඳපොළවල මිල ගණන් හි පොල් කටු අඟුරු මිල ඉහළ යාමෙන් ලාභය පහළ යාම හේතුවෙන් බදු ගෙවීමට පෙර ලාභය මධ්‍යස්ථව පැවතුණි.
- අගය එකතු කළ නිෂ්පාදන සහ භූගෝලීය ව්‍යාප්තියෙන් වැඩි දායකත්වයක් ලබා ගැනීමට අංශයට හැකිවිය.
- සැපයුම් දාමය ශක්තිමත් කිරීම කෙරෙහි සැලසුම් සකස් කිරීම සහ සැපයුම් දාමවල පසුබිම් ඒකාබද්ධතාවය සහ විවිධාංගීකරණය හරහා ආරක්ෂාව සහ ඔරොත්තු දීමේ හැකියාව පවත්වා ගැනීම.
- මැදිහත්වීම්, ඉලක්ක නිතිපතා නිරීක්ෂණය කිරීම සහ ශක්තිමත් ESG පාලනය හරහා ESG සැලසුම් ඒකාබද්ධ කිරීම.

#### ඉදිරි කටයුතු

ඇතැම් දියුණු රටවල් විසින් පාරිසරික කැපවීම් අඩු කිරීම හේතුවෙන් කෙටිකාලීන දැක්ම බාධාවන්ට මුහුණ දෙන අතර, එය බලශක්ති ගබඩා අංශයටද බලපෑ හැකිය, කෙසේ වෙතත් අනෙකුත් කලාපවල හිතකර ඉල්ලුමේ වර්ධනය මගින් එය සමනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. අගය එකතු කළ කාබන් නිෂ්පාදනවල වෙළඳපල කොටස වැඩි කිරීම සහ ආසියාව කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් වෙළඳපලවල භූගෝලීය විවිධාංගීකරණය කිරීම සැලසුම්ගත ප්‍රමුඛතා අතරට ඇතුළත් වේ.

| | 2025 | % y-o-y |
|---|---|---|
| ආදායම (රු. බිලියන) | **42.83** | 0.2 |
| බදුවලට පෙර ලාභය (රු. බිලියන) | **5.50** | -10 |
| බදුවලට පසු ලාභය (රු. බිලියන) | **4.26** | -1 |
| වත්කම් (රු. බිලියන) | **42.93** | 12 |
| සේවකයින් (අංක) | **2,026** | 5 |
| කාබන් පියසටහන ($tCO_2e$) | **44,554 (Scope 1,2 & 3)** | |

**248**
සැපයුම්කරුවන් එක් කර ගැනීම

රු. මිලියන **467**
නව නිෂ්පාදනවලින් ආදායම

EcoVadis
රන් සම්මානය අත්කර ගැනීම

### රෙදිපිළි අංශය

Hayleys Fabric PLC සහ South Asia Textiles Limited සමාගම විසින් නියෝජනය කරනු ලබන සමූහයේ රෙදිපිළි අංශය, රට තුළ පවතින විශාලතම රෙදිපිළි නිෂ්පාදකයා වේ. එය නවෝත්පාදනය, ගුණාත්මකභාවය සහ තිරසාරභාවය සඳහා බලවත් කීර්තියක් ලබා ගෙන ඇති අතර ප්‍රමුඛ පෙළේ ගෝලීය විලාසිතා සන්නාමවලට රෙදි සැපයීමට හැකි වී තිබේ.

#### 2024/25 වර්ෂයේ සුවිශේෂී අවස්ථා

- ප්‍රධාන ගනුදෙනුකරුවන් ඇණවුම් කල් දැමීම සහ ශ්‍රී ලංකා රුපියලේ අගය පහළ බැසීම හේතුවෙන් පරිමාව පහත වැටීම කාර්යසාධනයට බලපෑම් එල්ල කළේය.
- ආකර්ෂණීය, වේගයෙන් වර්ධනය වන වෙළඳ නාම කිහිපයක් නිෂ්පාදිත කළඹට එකතු කිරීමත් සමඟ වෙළඳ නාම විවිධාංගීකරණය කෙරෙහි සැලසුම් සකස් කිරීම.
- ස්වාභාවික සහ කෘත්‍රිම රෙදි වර්ග දෙකෙහිම මූලික, සාම්ප්‍රදායික, කපු මත පදනම් වූ රෙදිවලින් වාරික, අගය එකතු කළ නිෂ්පාදන වෙත මාරුවීම කෙරෙහි ඉදිරියටත් අවධානය යොමු කිරීම.

#### ඉදිරි කටයුතු

මෑත කාලීන භූ දේශපාලනික කටයුතු වෙළඳ ක්ෂේත්‍රයේ වෙනස්කම් ඇති කරමින් ගෝලීය අවිනිශ්චිතතාවය වැඩි කරනු ලැබීය. කර්මාන්තය සඳහා දිගුකාලීන අපේක්ෂාවන් නිශ්චිත වන අතර, නිෂ්පාදකයින් සඳහා සුවිශේෂී අවස්ථා ඉදිරිපත් කරයි. අංශය විසින් සාම්ප්‍රදායික නොවන වෙළඳපල වර්ධනය කෙරෙහි අවධානය යොමු කරනු අතර කෘත්‍රිම රෙදිපිළි අංශයේ ශක්තිමත් කරමින් එහි පාරිභෝගික පදනම තවදුරටත් විවිධාංගීකරණය කරයි.

| | 2025 | % y-o-y |
|---|---|---|
| ආදායම (රු. බිලියන) | **43.46** | -12 |
| බදුවලට පෙර ලාභය (රු. බිලියන) | **3.07** | -17 |
| බදුවලට පසු ලාභය (රු. බිලියන) | **2.11** | -15 |
| වත්කම් (රු. බිලියන) | **35.86** | - |
| සේවකයින් (අංක) | **3,397** | 3 |
| කාබන් පියසටහන ($tCO_2e$) | **204,896 (1, 2 සහ 3 මට්ටම)** | |

**9**
නව පාරිභෝගිකයින් එක් කර ගැනීම

**350**
නව නිෂ්පාදන වර්ධනය

කෙටි කාලීන සහ ශුද්ධ ශුන්‍ය විමෝචන ඉලක්ක සත්‍යාපනය ලබා ගැනීම

විද්‍යා පාදක ඉලක්ක මුලපිරීම (SBTi)

# වාර්ෂික වාර්තාවේ සාරාංශය 2024/25

## නිෂ්පාදිත කළඹ සමාලෝචනය

### ඉදිකිරීමේ ද්‍රව්‍ය

ඇලුමෙක්ස් යනු ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ඇලුමිනියම් නිස්සාරණ නිෂ්පාදකයා සහ අපනයනකරු වේ. නව්‍ය විසඳුම්, නිෂ්පාදන සැලසුම් කිරීමේ සහ නිෂ්පාදනයේ ලෝක මට්ටමේ හැකියාවන් සහ අසමසම ගුණාත්මකභාවය සඳහා කීර්තියක් උසුලයි.

**2024/25 වර්ෂයේ සුවිශේෂී අවස්ථා**

- අභ්‍යන්තර ඉල්ලුමේ ඉහළ යාම සහ අපනයන පරිමාවන්හි ශක්තිමත් වර්ධනය මගින් කාර්ය සාධනය තහවුරු කිරීම.
- අති නවීන තාක්ෂණය ඇතුළත් උසස් පහසුකමක් වන Ascend ආරම්භ කිරීමත් සමඟ නිෂ්පාදන පියසටහන ශක්තිමත් කරන ලද අතර තාක්ෂණික හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා ආයෝජනය කිරීම.
- Aluminium Stewardship Initiative (ASI) සහතිකය ලබා ගැනීම.
- Hayleys Lifecode හි අරමුණුවලට අනුකූලව Elevate මාර්ග සිතියම ඉදිරිපත් කිරීම.

**ඉදිරි කටයුතු**

2025/26 වර්ෂයේදී රටේ ඉදිකිරීම් අංශය මගින් වර්ධනයක් අපේක්ෂා කළ අතර, සාර්ව ආර්ථික තත්ත්වයන් ස්ථාවර කිරීම, හිතකර පොලී අනුපාත සහ රජයේ සහ පෞද්ගලික අංශ දෙකෙහිම විශාල ව්‍යාපෘති ආරම්භ කිරීම ඊට හේතු විය. සාම්ප්‍රදායික නොවන වෙළඳපොළ සහ අගය එකතු කළ නිෂ්පාදන යෝජනාවල පැවැත්ම ශක්තිමත් කිරීම පිළිබඳඅවධාරණය කරනු ලබයි.

| | 2025 | % y-o-y |
|---|---|---|
| ආදායම (රු. බිලියන) | 13.11 | 32 |
| බදුවලට පෙර ලාභය (රු. බිලියන) | 1.14 | 392 |
| බදුවලට පසු ලාභය (රු. මිලියන) | 867 | 366 |
| වත්කම් (රු. බිලියන) | 16.56 | 29 |
| සේවකයින් (අංක) | 1,001 | -29 |
| කාබන් පියසටහන (tCO2e) | 12,660 (1,2 සහ 3 මට්ටම) | |

**56%** අපනයන පරිමාවන්හි වර්ධනය

**24** නව නිෂ්පාදන

**ASI** සහතිකය ලබා ගැනීම

### වැවිලි අංශය

මෙම අංශය වතු 55 ක් පුරා තේ, රබර් සහ අනෙකුත් භෝග හෙක්ටයාර 13,000කට වඩා සාමූහිකව වගා කරනු ලබන ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ කලාපීය වැවිලි සමාගම් (RPC) තුනකින් සමන්විත වේ.

**2024/25 වර්ෂයේ සුවිශේෂී අවස්ථා**

- භෝග සහ මිල ගණන්වල වර්ධනය හේතුවෙන් ආදායම ඉහළ ගියද, වැටුප් සහ අනෙකුත් වියදම්වල වර්ධනය ලාභදායිතාවයට බලපෑවේය.
- තලවකැලේ තේ වතු මගින් කිරුවානගඟ ප්‍රදේශයේ අති නවීන තේ කර්මාන්ත ශාලාවක් ආරම්භ කරන ලදී.
- RPC ත්‍රිත්වය තිරසාරභාවය, නවෝත්පාදනය සහ ගුණාත්මකභාවය සම්බන්ධයෙන් කර්මාන්තයේ පෙරමුණ ගෙන සිටින අතර කොළඹ තේ වෙන්දේසියේ ඉහළම මිල ගණන් දරයි.

**ඉදිරි කටයුතු**

නිෂ්පාදන පිරිවැය වැඩිවීම, ශ්‍රම හිඟය සහ දේශගුණික විපර්යාසවල තීව්‍රතාව හේතුවෙන් රටේ තේ කර්මාන්තයේ ඉදිරි දැක්ම අභියෝගාත්මකව පවතින අතර, මෑත වසරවලදී එහි සාම්ප්‍රදායික මෙහෙයුම් වෙනස් කිරීම සඳහා ගෙන ඇති පියවර හේතුවෙන් එකී අවස්ථාවන්ට මුහුණදෙමින් ශුභවාදීව පවතී.

| | 2025 | % y-o-y |
|---|---|---|
| ආදායම (රු. බිලියන) | 19.18 | 6 |
| බදුවලට පෙර ලාභය (රු. බිලියන) | 2.91 | -18 |
| බදුවලට පසු ලාභය (රු. බිලියන) | 1.91 | -15 |
| වත්කම් (රු. බිලියන) | 27.28 | 8 |
| සේවකයින් (අංක) | 15,775 | 3 |
| කාබන් පියසටහන (tCO2e) | 38,420 (1,2 සහ 3 මට්ටම) | |

**122** නව නිෂ්පාදන වර්ධනය

**40%** බෙදූ ආදායම් මත වැවිලි වගාව

රු. මිලියන **744** පුනර්ජනනීය කෘෂිකර්මාන්තය සඳහා ආයෝජන

# වාර්ෂික වාර්තාවේ සාරාංශය 2024/25

## නිෂ්පාදිත කළඹ සමාලෝචනය

### කෘෂිකර්මාන්තය

දේශීය හා අපනයන වෙළඳපොළට කෘෂිකර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන සහ සේවාහි පූර්ණ ශක්‍යතාවයක් ලබා දෙමින් මෙම අංශය ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික කර්මාන්තයේ ප්‍රමුඛයෙකු ලෙස කටයුතු කරයි.

2024/25 වර්ෂයේ සුවිශේෂී අවස්ථා

- ව්‍යාපාරවල භූගෝලීය පියසටහන සහ විවිධත්වය උපයෝගී කර ගනිමින් සැලකිය යුතු බාහිර අභියෝග මධ්‍යයේ වුවද මෙම අංශය ඔරොත්තු දෙන කාර්ය සාධනයක් ලබා දුන්නේය.
- බංග්ලාදේශයේ නිෂ්පාදන පිරිනැමීම පුළුල් කිරීම කෙරෙහි නිරන්තර අවධානය යොමු කිරීම.
- ශීත කළ පොල් වතුර හඳුන්වාදෙමින් ව්‍යාපාර කටයුතු විවිධාංගීකරණය කිරීම.

ඉදිරි කටයුතු

ප්‍රතිපත්ති මාරුවීම්, ආර්ථික හා දේශගුණික අභියෝග, ශ්‍රම හිඟයන් සහ අකාර්යක්ෂමතාව හේතුවෙන් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ කාර්යසාධනය පසුබෑමට ලක්ව ඇත. දිගුකාලීන තිරසාරභාවය සහ ආහාර ආරක්ෂාව සඳහා ඵලදායිතාව වැඩි දියුණු කිරීමේ කඩිනම් අවශ්‍යතාවය එමඟින් ඉස්මතු කරයි. මෙකී තත්වය යටතේ, නිෂ්පාදන කළඹ පුළුල් කිරීම සහ බංග්ලාදේශය වෙත නිෂ්පාදන පිරිනැමීම පුළුල් කිරීම කෙරෙහි අංශය අවධානය යොමු කරනු ඇත. එමෙන්ම මූලික ප්‍රධාන සැපයුම් දාමවල අධීක්ෂණය සහ සහයෝගීතාවය වැඩිදියුණු කිරීම කෙරෙහිද අවධානය යොමු කරයි.

| | 2025 | % y-o-y |
|---|---|---|
| ආදායම (රු. බිලියන) | 37.51 | 8 |
| බදුවලට පෙර ලාභය (රු. බිලියන) | 2.60 | -14 |
| බදුවලට පසු ලාභය (රු. බිලියන) | 1.5 | -26 |
| වත්කම් (රු. බිලියන) | 29.33 | +13 |
| සේවකයින් (අංක) | 1,223 | -2 |
| කාබන් පියසටහන (tCO2e) | 12,312 (1,2 සහ 3 මට්ටම) | |

**34**
නව නිෂ්පාදන

**6%**
Heychem
බංග්ලාදේශය මඟින් ආදායම වර්ධනය

රු. මිලියන **131**
නව ව්‍යාපාර මාර්ග වලින් ආදායම

### පාරිභෝගික සහ විකුණුම් අංශය

සිංගර් (ශ්‍රී ලංකා) පීඑල්සී යනු පාරිභෝගිකයින් වෙත කල් පවතින භාණ්ඩ ලබා දෙන කර්මාන්තයේ ප්‍රමුඛයෙකු වන අතර, එය ගේදොර කටයුතුවලදී අත්‍යවශ්‍ය සන්නාමයක් ලෙස කටයුතු කරනු ලබයි. ශ්‍රී ලංකාවේ ප්‍රොක්ටර් සහ ගැම්බල් නිෂ්පාදන සඳහා බෙදාහරින්නෙකු වන හේලීස් පාරිභෝගික අංශය ද මෙම අංශයට ඇතුළත් වේ.

2024/25 වර්ෂයේ සුවිශේෂී අවස්ථා

- සිංගර් වසර තුළ වාර්තාගත ලාභයක් අත්කර ගත්තේය. වඩාත් හිතකර වෙළඳපල තත්ත්වයන් සහ එහි ජාලය පුරා කාලෝචිත වෙළඳපල සක්‍රීයතාව මේ සඳහා සහය විය.
- පාරිභෝගික කාණ්ඩ විවිධාංගීකරණය කිරීම අනුගමනය කරමින් නිෂ්පාදන සහ වෙළඳ නාම කළඹ පුළුල් කිරීම.
- ප්‍රදර්ශනාගාර වැඩිදියුණු කිරීම සහ පාරිභෝගික අත්දැකීම් වැඩිදියුණු කිරීම කෙරෙහි අඛණ්ඩ අවධානයක් යොමු කිරීම.

ඉදිරි කටයුතු

රටේ ස්ථාවර වෙමින් පවත්නා සාර්ව ආර්ථික සංරචක, හිතකර පොලී අනුපාතයන් සහ විනිමය අනුපාතයන් මෙන්ම වර්ධනය වෙමින් පවතින පාරිභෝගික ආදායම් මට්ටමත් සැලකිල්ලට ගත් විට කර්මාන්තයේ ඉදිරි දැක්ම ඉතා යහපත් හා සුබදායක වනු ඇත. මෙම අංශය, නිෂ්පාදන හා වෙළඳනාම විවිධාංගීකරණය කරමින් පාරිභෝගික සේවා සහ අලෙවියෙන් පසු සේවාවන් පිළිබඳ උද්යෝගිමත්, සැලසුම් සහගත මුහුණුවරකින් කටයුතු කිරීමට අවධානය යොමු කරනු ඇත.

| | 2025 | % y-o-y |
|---|---|---|
| ආදායම (රු. බිලියන) | 108.48 | 33 |
| බදුවලට පෙර ලාභය (රු. බිලියන) | 6.53 | 10-fold |
| බදුවලට පසු ලාභය (රු. බිලියන) | 4.39 | 25-fold |
| වත්කම් (රු. බිලියන) | 124.47 | 32 |
| සේවකයින් (අංක) | 3,444 | 4 |
| කාබන් පියසටහන (tCO2e) | 19,197 (1,2 සහ 3 මට්ටම) | |

**89%**
ශුද්ධ ප්‍රවර්ධකය මට්ටම

**9.6%**
මෙහෙයුම් ලාභයේ ආන්තිකය

# වාර්ෂික වාර්තාවේ සාරාංශය 2024/25

## නිෂ්පාදිත කළඹ සමාලෝචනය

### සංචාරක අංශය

මෙම අංශය ආගන්තුක සත්කාර අංශයේ ප්‍රමුඛයෙකු ලෙස කටයුතු කරනු ලබයි. හෝටල්, නිවාඩු නිකේතන, සුවතා නිවාඩු නිකේතන ජාලයක් සහ ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ කළමනාකරණය කරනු ලබන විශේෂ හෝටල් එකතුවක් මෙම අංශය සතුය.

2024/25 වර්ෂයේ සුවිශේෂී අවස්ථා

